# CENTRE FOR MONITORING ELECTION VIOLENCE
# මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය
# தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

**No:** 24/2, 28th Lane, Off Flower Road, Colombo 07
**Tel:** +94 11 2565304 – 6, 5552746, 5552749, **Fax:** +94 114714460
**E-mail:** cmev@cpalanka.org **Website:** www.cpalanka.org

## උතුරු පළාත් සභා ඡන්ද විමසීම 2013

## මාධ්‍ය නිවේදනය - අංක 02

2013 සැප්තැම්බර් 15 වැනි ඉරිදා සවස 4 .30 වන විට පහත සඳහන් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා වලට අදාළ සිදුවීම් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (මැ .ප්‍ර .නි .ම.) වෙත ලැබී ඇත.

**2013 සැප්තැම්බර් 13 කොඩිකාමම් මැතිවරණ කොට්ඨාශය, යාපනය මැතිවරණ දිස්ත්‍රික්කය , උතුරු පළාත,**

මැ .ප්‍ර. නි. ම. ක්ෂේත්‍ර නිරීක්ෂක වාර්තා කළ පරිදි ප්‍රචාරක පත්‍රිකා බෙදමින් මැතිවරණ ප්‍රචාරක කටයුතු වල නිරත දෙමළ ජාතික සංධානයේ ආධාරකරුවන්ගෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ (CID) නිළධාරීන් ප්‍රශ්න කර ඇති අතර අනතුරුව ඔවුන් අත් අඩංගුවට ගන්නා ලෙස පොලීසියට දැනුම් දී ඇත. ඒ අනුව පොලීසිය දෙ. ජා .ස. අපේක්ෂක චන්ද්‍රලිංගම් සුගීර්ධන්ගේ (අපේක්ෂක අංක 14) ආධාරකරුවන් සිව් දෙනෙක් අත් අඩංගුවට ගෙන ඇත. සිදුවීම පිළිබඳ එම පක්ෂයේම කේසවන් සජන්දන්ගෙන් (අපේක්ෂක අංක 13) විමසූ අවස්ථාවේදී ඔහු පැවසුවේ තම ආධාරකරුවන් මැතිවරණ නීතිය උල්ලංඝණය කර ඇති බව පොලීසිය පැවසූ බවයි . කොඩිකාමම් පොලීසියද එම සිදුවීම තහවුරු කරන ලදි.

**2013 සැප්තැම්බර් 15 වැනි දින ඒ 32 මාර්ගයේ මරවන්වුලි මංසන්ධිය, චාවකච්චේරි මැතිවරණ කොට්ඨාශය, යාපනය මැතිවරණ දිස්ත්‍රික්කය , උතුරු පළාත**

දෙමළ ජාතික සංධානයේ අපේක්ෂක කජදීපන් ( අපේක්ෂක අංක 17) තම මැතිවරණ ප්‍රචාරක කටයුතුවල නිරත වෙමින් සිටින අවස්ථාවේදී එදින සවස 5 ට පමණ එම ස්ථානයට පැමිණ ඇති නාඳුනන කණ්ඩායමක් ඔවුන් හට පොළුවලින් පහර දී ඇත. අනතුරුව පහරදුන් පුද්ගලයන් වාහනයකින් (ලියාපදිංචි අංක 59 - 3641) ප්‍රදේශයෙන් පලාගොස් ඇත.එම පහර දීමෙන් තුවාල ලත් ඥානප්‍රකාශම් කිෂෝර් හා රාජ කුමාර් රජින්දන් යන අය ප. ව. 7. 55 ට පමණ චාවකච්චේරි රෝහල (වාට්ටු අංක 06) වෙත ඇතුළත් කර ඇත. මැ. ප්‍ර .නි .ම. මෙම කරුණ පිළිබඳ විමසූ අවස්ථාවේදී චාවකච්චේරි පොලීසියේ සැරයන් සුනිල් එම සිදුවීම තහවුරු කළ අතර ඒ පිළිබඳ වැඩිදුර පරීක්ෂණ සිදු කරන බව ද ප්‍රකාශ කළේය.

**2013 සැප්තැම්බර් 14 වැනි දින පේදුරු තුඩුව මැතිවරණ කොට්ටාශය, යාපනය මැතිවරණ දිස්ත්‍රික්කය, උතුරු පළාත**

ආරක්ෂක හේතූන් මත තම අනන්‍යතාවය හෙළි කිරීමට අකමැති සිදුවීම ඇසින් දුටු පිරිස් වාර්තා කරන පරිදි හමුදා බුද්ධි අංශය හා ඊ. පී .ඩී. පී .පක්ෂයට සම්බන්ධ යම් යම් පුද්ගලයන් දෙ. ජා. ස .මැතිවරණ ප්‍රචාරක රැස්වීම් වලට බාධා පැමිණෙන ලෙස කටයුතු කර ඇත. ප්‍රජා ශාලාවක පැවැත්වීමට නියමිතව තිබූ එම ප්‍රචාරක රැස්වීම ඉහත පිරිස්වල බාධා කිරීම් නිසා අසල පිහිටි වෙනත් ඉඩමක පැවැත්වීමට කටයුතු කර තිබූ අතර ඔවුන් ජනතාවට ප්‍රකාශ කර තිබුණේ මෙම රැස්වීමට සහභාගි නොවන ලෙසයි . මැ. ප්‍ර .නි .ම. දෙමළ ජාතික සංධාන අපේක්ෂක සුගීර්දන් මහතා ඇමතූ අවස්ථාවේ ඔහු සඳහන් කළේ ඊ.පී .ඩී. පී. හා හමුදා බුද්ධි අංශයේ සමහර සාමාජිකයන් අදාළ

රැස්වීමට බාධා පැමිණ වු බවකි. පේදුරුතුඩුව පොලීසියේ උප පොලිස් පරීක්ෂක ආර්. පී. ලලිත් සඳහන් කරන ලද්දේ ඉහත කී ප්‍රචාරක රැස්වීම භාරතී ප්‍රජා ශාලාවේ පැවැත්වීමට අදාළව එම ඉඩමේ අයිතිකරු මුලින් ලබා දී තිබූ අවසරය  ඉවත් කරගත් බවත් වෙනත් ස්ථානයක් එම රැස්වීම පැවැත්වීම සඳහා ලබා දුන් බවත්ය. තව දුරටත් ඔහු පැවසුවේ අදාළ රැස්වීමෙන් අනතුරුව හානි කර ඇතැයි සඳහන් වූ ශබ්ද විකාශන යන්ත්‍ර පිළිබඳ සිදුවීමක් වාර්ථා වී නැති බවයි.

**2013  සැප්තැම්බර් 15 වැනි දින සිරුප්පිඩි දකුණ,  කෝපායි  මැතිවරණ කොට්ඨාශය, යාපනය මැතිවරණ දිස්ත්‍රික්කය , උතුරු පළාත**

දෙමළ ජාතික සංධානයේ ආධාරකරුවන්ට අයත්  කෙසෙල් හා බීට් රූට් වගාවන්  කීපයක් විනාශ කොට ඇති බව මැ.ප්‍ර.නි.ම. ට වාර්ථා වී ඇත. මැ.ප්‍ර.නි.ම. ක්ෂේත්‍ර නිරීක්ෂකයන් අදාළ සිදුවීම සම්බන්ධයෙන් කරුණු විමසීමේදී ගම්වැසියන් පවසා ඇත්තේ දෙ.ජා.සං. මැතිවරණ ප්‍රචාරක රුස්වීම් නවතාලන ලෙස දන්වමින් සිටි එ.ජ.නි.ස. ආධාරකරුවන් මෙකී හානිය සිදු කරන්නට ඇති බවයි. ගම්වැසියෙක් වන උදයරාසා මහතා පැවසුවේ තම කෙසෙල් වගාවට සිදුව ඇති හානිය  රු.20 000 කට වඩා අධික බවයි. අච්චුවේලි පොලීසිය සිදුවීම තහවුරු කරමින් තමන් වෙත ගම්වැසියන් දෙදෙනෙක්  (අයියන්පිල්ලෙයි රත්නසාමි ,පැමිණිලි අංක  MOIB 234- 39 සහ මානික්කම් උයද කුමාර් MOIB 236- 40 ) පැමිණිලි කර ඇති බව පැවසූ අතර පොලිස් නිළධාරීන් අදාළ ස්ථානය වෙත පිටත් කොට ඇති බවද සඳහන් කළේය.

මැ.ප්‍ර.නි.ම. නිරීක්ෂණය කළ පරිදි මෙම සිද්ධිය පොලීසිය මැතිවරණයට අදාළ සිදුවීමක් ලෙස සටහන් කරගෙන නොමැති අතර වෙනත් ආකාරයේ පැමිණිල්ලක් ලෙස සටහන් කර ඇත. කෙසේ වෙතත් ගම්වැසියන් මේ සම්බන්ධයෙන්  එ.ජ.නි.ස. අපේක්ෂක හමීඩ් නවුමාන් සිරාන් මොහොමඩ් මහතාට චෝදනා එල්ල කරන අතර ඔහු ඇමතූ අවස්ථාවේදී මැ.ප්‍ර.නි.ම. ට  ඔහු පැවසූවේ මෙකී ගම්මානයට තමන් බොහෝ සහය ලබා දී ඇති බවත් මෙකී සිදුවීමට තමන්ගේ ඇතැයි කියන සම්බන්ධය තරයේ ප්‍රතික්ෂේප කරන බවත්ය.



ආචාර්ය පී. සරවනමුත්තු
සම කැඳවුම්කරු



සුනිල් ජයසේකර
සම කැඳවුම්කරු



උදය කළුපතිරණ
සම කැඳවුම්කරු